ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018 ඔක්තෝබර් මස 30 වැනි දින** |


## මැතකාලීන ආර්ථික ප්‍රවණතා: 2018 සුවිශේෂ සිදුවීම් සහ 2019 අපේක්ෂාවන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය අර්ධ වාර්ෂික ප්‍රකාශනය වන "මැතකාලීන ආර්ථික ප්‍රවණතා: 2018 සුවිශේෂ සිදුවීම් සහ 2019 අපේක්ෂාවන්" අද දින එළි දක්වන ලදී.


මෙම ප්‍රකාශනයෙහි අන්තර්ගත වන පරිදි 2018 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ශ්‍රී ලංකා ආර්ථිකය, ගෝලීය වෙළඳපොළ තුළ සිදුවන වෙනස්වීම් හේතුවෙන් ඇතිවූ නව අභියෝගවලට මුහුණ දුන් අතර, එය වසරේ පළමු කාර්තුව දක්වා ආර්ථිකයෙහි දැකිය හැකි වූ මනා ස්ථායීකරණය කෙරෙහි බාධා කළේය. 2017 වසරේදී සියයට 3.3 ක සාපේක්ෂව අඩු වර්ධනයක් වාර්තා කිරීමෙන් අනතුරුව 2018 වසරේ පළමු භාගය තුළදී ආර්ථිකය සියයට 3.6 ක මධ්‍යස්ථ වේගයකින් වර්ධනය විය. මෙම කාලය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් 2018 වසරේ පළමු භාගය තුළදී කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය. ප්‍රධාන වශයෙන්, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් උප අංශවල දැකිය හැකි වූ මන්දගාමී ක්‍රියාකාරිත්වය හේතුවෙන් කාර්මික කටයුතුවල වර්ධනය අඩු විය. මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා කටයුතුවල වර්ධනය හේතුවෙන් සමස්තයක් ලෙස සේවා අංශයේ ක්‍රියාකාරකම්වල වර්ධනයක් දැකිය හැකි විය. මේ අතර, 2018 වසරේ පළමු භාගය තුළදී සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යෑමක් දැකිය හැකි විය. ප්‍රධාන වශයෙන්, ආහාර මිල ගණන් විචලනය වීම සහ දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් මිල ගණන් හා අනෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික මිල උද්ධමනයෙහි තාවකාලික ඉහළ යෑමක් ඇතැම් මාසවලදී දැකිය හැකි වුවද, 2018 වසරේ මේ දක්වා කාලය තුළ පාරිභෝගික මිල උද්ධමනය අඩු මට්ටමක පවතී.

කාර්තුමය මූර්ත ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)





මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)





මේ අතර, පසුගිය කාලය තුළදී අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තියට ප්‍රතිචාර දක්වමින්, මුදල් හා ණය ප්‍රසාරණය ක්‍රමයෙන් මන්දගාමී විය. මුදල් ප්‍රතිපත්තිය හා මෙහෙයුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කරමින්, 2018 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව පහත හෙළන ලද අතර, වෙනස්වන වෙළඳපොළ තත්ත්වයන්ට ගැළපෙන පරිදි, සුදුසු විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම මගින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතික පොලී අනුපාතික කොරිඩෝව තුළ වෙනස් වීමට ඉඩ සලසන ලදී.

තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම





වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය





විදේශ අංශය සැලකීමේදී, සංචාරක ඉපැයීම් ද ඇතුළත් සේවා අපනයන ආදායම ඉහළ යෑම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මගින් විදේශ ජංගම ගිණුමේ හිඟය යම් දුරකට පියවා ගත හැකි වුවද, වෙළඳ භාණ්ඩ අපනයන ආදායම ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම වැඩිවීම හේතුවෙන් වෙළඳ හිඟය තවදුරටත් පුළුල් විය. ඉන්ධන, මෝටර් රථ සහ රත්‍රන් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හා ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම මධ්‍යයේ, ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම හමුවේ නැගී එන වෙළඳපොළ ආර්ථික වෙතින් ආයෝජන ඉවතට ගලා යෑම හා එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් ගෙවුම් ශේෂය ද පීඩනයට ලක් විය. මේ හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ දැඩි අවප්‍රමාණයකට හේතු වූ අතර, ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මගින් විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හරින අතරතුර, විනිමය අනුපාතිකයේ ඉහළ උච්චාවචන පැවති අවස්ථාවලදී මහ බැංකුව වෙළඳපොළට මැදිහත් විය.

**වෙළඳ ශේෂය සහ ජංගම ගිණුමේ ශේෂය**





**දළ නිල සංචිත සහ විනිමය අනුපාතිකය**





මේ අතරතුර, වර්තන ගිණුමේ ශේෂය සුළු අඩුවීමක් පෙන්නුම් කිරීමත්, සමස්ත අයවැය ශේෂය සහ ප්‍රාථමික ශේෂය වර්ධනය වීමත් සමඟ වසරේ මුල් මාස අට තුළදී රාජ්‍ය මූල්‍ය අංශයේ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, රාජ්‍ය වියදම්වල යම් අඩුවීමක් දක්නට ලැබුණ ද, ආදායම් එක්රැස් කිරීම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවීම හේතුවෙන් 2018 වසරේදී පවත්වා ගැනීමට ඉලක්ක කරන ලද අයවැය හිඟය පවත්වා ගැනීම අභියෝගාත්මක වනු ඇත.

**රාජ්‍ය ආදායම සහ වියදම**




**ප්‍රධාන අයවැය ශේෂ**





2018 වසරේ පළමු භාගය තුළදී මූල්‍ය අංශය කැපී පෙනෙන සාර්ව විචක්ෂණ ගැටලු වාර්තා නොකොට අඛණ්ඩව වර්ධන ප්‍රවණතාවක් පවත්වා ගත් අතර, අර්බුදයන්ට පත් වී ඇති මුදල් සමාගම් කිහිපයක දීර්ඝ කාලයක් පුරා පැවති ගැටලු නිරාකරණය කිරීමට පියවර ගනු ලැබීය.


මේ අතර, වෙනස් වූ ගෝලීය ආර්ථික තත්ත්වයන් හමුවේ විදේශ සංචිත සම්බන්ධයෙන් වූ ඉලක්කය ළඟා කර ගත නොහැකි වුවද, රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රාථමික ශේෂය සහ උද්ධමනය ආශ්‍රිතව 2018 වසර ජූනි මස සඳහා වූ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක සාර්ථක ලෙස ළඟා කර ගැනීමත් සමඟ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඛනිජ තෙල් මිල තීරණය කිරීම සඳහා ස්වයංක්‍රීය මිලකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම ද ඇතුළුව මෙම වැඩසටහන යටතේ වූ සැලකිය යුතු ව්‍යුහාත්මක මිනුම් දඬු කිහිපයක් ද මෙම කාලය තුළ ක්‍රියාවට නංවන ලදී.

# 2018 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය සංක්ෂිප්තයක් ලෙස...


*ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම ධනාත්මක වර්ධනයක් සිදු වුවද, ශ්‍රී ලංකාවේ වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු අගයක පැවතුණි...*





*ආහාර මිල ගණන් විචලනය හා පාලිත මිල ගණන් සංශෝධන හමුවේ ඉහළ පහළ යෑම් සිදු වුවද, උද්ධමනය පහළ මට්ටමක පැවතුණි...*




*...හිතකර උද්ධමන අපේක්ෂාවන් ද ඇතුළු මෙම තත්ත්වයන්, 2015 වසරේ අග සිට දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් පසු, 2018 අප්‍රේල් 04 දින නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පහත දැමීමට මහ බැංකුව පෙළඹවීය.*




*විදේශීය අංශය සැලකීමේදී, සංචාරක ඉපැයීම්, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සෘජු විදේශීය ආයෝජන හා රජය වෙත ණය ලැබීම්, ගෙවුම් ශේෂය මත පීඩනය යම්තාක් දුරකට අවම කළද, අපනයන ආදායම ඉක්මවා ආනයන වියදම ඉහළ ගියේය.*





*ගෝලීය මූල්‍ය වෙළඳපොළ විචලනය ඉහළ යෑම, බොරතෙල් මිල ගණන් වැඩි වීම සහ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් රුපියල අවප්‍රමාණය වූ අතර, එය ජංගම ගිණුමේ හිඟයක් සහිත අනෙකුත් නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් මත ඇති කළ පීඩනයට සමාන විය.*

එ.ජ. ඩොලරයට සාපේක්ෂව මුදල් අවප්‍රමාණය වීම
(2018 සැප්තැම්බර් අග දක්වා)




*නිෂ්පාදන ආර්ථිකය නංවාලීම සහ භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදුකිරීමේ අවශ්‍යතාව මෙමගින් යළි අවධාරණය කළද, මෙම තත්ත්වය විසඳීම සඳහා රජය හා මහ බැංකුව කෙටි කාලීන පියවර රැසක් ගෙන ඇත...*

*...රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සමග, රාජ්‍ය මූල්‍ය අංශයේ දැනටමත් දැකිය හැකි ජයග්‍රහණ ගොඩනැගීම සඳහා තවත් බොහෝ දේ කළ යුතුව ඇත.*



ඉදිරියේදී, දේශීය නිෂ්පාදිතය, වෙළඳ සහ සේවා අපනයන මෙන්ම, දේශීය සහ විදේශීය ආයෝජන සඳහා පහසුකම් සැලසීමට ගනු ලබන ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින් ආර්ථිකය වේගවත් වර්ධනයක් ක්‍රමිකව අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන් ගත් විට, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ අපේක්ෂිත අඩු සහ ස්ථාවර උද්ධමනයක් පවත්වා ගැනීම, තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම සහ රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න අඛණ්ඩව පවත්වාගෙන යෑම තුළින් සාර්ව ආර්ථික ස්ථායීතාවක් සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

අඩු ආර්ථික ක්‍රියාකාරිත්වයක් මධ්‍යයේ, මුදල්, රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශවල පවතින ප්‍රතිපත්ති අවකාශය සීමා වීම හමුවේ ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා උපකාරී වන විචක්ෂණශීලී, ස්ථාවර සහ දූරදර්ශී ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සමඟ පෞද්ගලික අංශය මුල්කොට ගත් ආර්ථික වර්ධනයක් සඳහා පහසුකම් සැලසීම අවශ්‍ය වේ. රටේ සාර්ව ආර්ථික මූලධර්ම වැඩිදියුණු කරමින්, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැදගත්කම මෑතකාලීන අත්දැකීම් මගින් නැවතත් අවධාරණය කර ඇත. අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාද කිරීම, දේශීය හා විදේශීය අහිතකර බලපෑම් සඳහා ආර්ථිකය වැඩි වශයෙන් නිරාවරණය වීම තුළින් ශ්‍රී ලංකාව කලාපීය රටවල් අතර තවදුරටත් පසුගාමී ආර්ථිකයක් බවට පත් වීමට පමණක් හේතු වේ. එමනිසා, වඩා ඵලදායී ලෙස මානව හා භෞතික සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වන ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් දක්වා ශ්‍රී ලංකාවට ඉදිරියට යෑම සඳහා, එවැනි ප්‍රතිසංස්කරණ විනිවිදභාවයකින් යුතු රාමුවක් යටතේ කඩිනමින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.